## දිවිමගට රුකුලක්

# ඔබට පුහුණුව දෙන ආයතන

කර්මාන්ත හා විශේෂ ආධුනික මට්ටමින් යුත් පුහුණු කිරීමේ වැඩ පිළිවෙලක් ජාතික ආධුනිකත්ව මණ්ඩලය විසින් දැනට ක්‍රියාත්මක කෙරේ. කර්මාන්ත ආධුනිකයෙක් විශේෂ කර්මාන්තයක්, සම්බන්ධයෙන් පුහුණු කාර්මිකයෙක් කිරීමට පුහුණු කරනු ලැබේ. කර්මාන්ත වල කණිෂ්ඨ කළමනාකාර ශ්‍රේණියෙහි රැකියාවන් උදෙසා විශේෂ ආධුනිකයෙකු ඉංජිනේරු අංශයෙහි පුහුණු කෙරේ.

සියළුම වර්ගයේ ආධුනිකයින් පුහුණු කිරීමේ යෝජනා ක්‍රමය සකස් කරන්නේත්, ක්‍රියාත්මක කරන්නේත්, අධ්‍යක්ෂණය කරන්නේත්, ජාතික ආධුනිකත්ව මණ්ඩලය විසිනි. මණ්ඩලයේ විශේෂ කමිටු මගින් සකස් කෙරෙන පුහුණු කිරීමේ ප්‍රමිතයනට අනුකූලවන පරිදි රජයේ හා පෞද්ගලික අංශයේ ආයතනවල ආධුනිකයෝ ස්වකීය ප්‍රායෝගික පුහුණුව ලබති. පුහුණුව නිම කිරීමෙන් පසුව, සියළුම ආධුනිකයින්ගේ ප්‍රවීණතා අනුව තක්සේරු කර, ඔවුනට සහතික නිකුත් කෙරේ.

පුහුණුව දෙනු ලබන ආයතන වල සේවා යෝජකයින් සමග සියළුම ආධුනිකයින් ආධුනිකත්ව ගිවිසුමකට එළඹිය යුතුය.

### පාඨමාලා පිළිබඳ විස්තර

1. ඒ වර්ගය – කර්මාන්ත ආධුනිකත්ව පාඨමාලා

යාන්ත්‍රික කර්මාන්තය, ක්‍රියාකාරි කර්මාන්ත, මුද්‍රණ කර්මාන්ත, කෘෂි කර්මය හා මැසීම් කර්මාන්තය, ගොඩනැගිලි කර්මාන්තය, ලීවැඩ, විදුලි කර්මාන්ත, ඉලක්ට්‍රොනික් හා විදුලි සංදේශ කර්මාන්ත, ධීවර හා සංස්කාර්ය කර්මාන්ත, වැද්දුම් හා සංස්කාර්ය කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය, ලෝහ වැඩ ගැසීම හා යන්ත්‍ර කර්මාන්තය, කාර්මාන්තය, කාර්යාල යන්ත්‍රෝපකරණ හා උපකරණ කර්මාන්තය, මුද්‍රණ හා නිම්හම් කර්මාන්තය, රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය, පාවහන් හා සම් භාණ්ඩ සෑදීමේ කර්මාන්තය, ආහාරපාන සැපයීම හා භෝජනශාලා ව්‍යාපාරය, රෙදිපිළි හා ඇඳුම් කර්මාන්ත, ලිපිකාර ආශ්‍රිත සේවා

කාලය: අවුරුදු 1–4

මට්ටම: කර්මාන්ත ශිල්පි

ස්ථානය: රජයේ හා පෞද්ගලික ආයතන

ඇතුළත්වීමේ අවශ්‍යතා: දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව හා ගණිතය/අංක ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් සමත්වීම.

තෝරාගනු ලබන: ක්‍රමය ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන් ලබාගත යුතු ආකෘති පත්‍රයක් පුරවා, ලියා පදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතුය. ලියාපදිංචි වූ අපේක්ෂකයින්, සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.

පුහුණුව සඳහා අය කෙරෙන ගාස්තු: කිසිදු මුදලක් අය නොකෙරේ.

අභ්‍යාසලාභීන්ට මුදලින් කෙරෙන ආධාර: පහත දැක්වෙන පරිදි, මාසික වේතනයක් ගෙවනු ලැබේ.

ප්‍රථම වර්ෂය: රු: 300/-

දෙවන වර්ෂය: රු; 315/-

තෙවන වර්ෂය: රු; 333/-

සතරවැනි වර්ෂය රු: 345/-

2. අ 2 වර්ගය කර්මාන්ත ආධුනික පාඨමාලා:

යාන්ත්‍රික කර්මාන්ත, ගොඩනැගිලි කර්මාන්ත, කෘෂි කර්ම හා වැවිලි කර්මාන්ත, විදුලි කර්මාන්ත, ක්‍රියාකාරී කර්මාන්ත, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ කර්මාන්ත, ධීවරකර්මාන්තය, වැද්දුම් කර්මාන්ත, ලෝහ හැඩ ගැසීම හා යන්ත්‍ර කර්මාන්ත, කාර්යාල යන්ත්‍රෝපකරණ හා ශීතුම් උපකරණ, රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත, මුද්‍රණ හා නිම්හම්

කර්මාන්ත, පාවහන් හා සම් භාණ්ඩ සෑදීමේ කර්මාන්ත, රෙදිපිළි හා ඇඳුම් කර්මාන්ත, ලී වැඩ කර්මාන්ත.

කාලය: අවුරුදු 1 – 4

මට්ටම: කර්මාන්ත ශිල්පි

ස්ථාන: රජයේ හා පෞද්ගලික අංශයේ ආයතන

ඇතුළත්වීමේ අවශ්‍යතා: හත් වැනි ශ්‍රේණිය සමත්වීම

තෝරාගනු ලැබීමේ ක්‍රමය: ලියාපදිංචිවීම සඳහා ජා.ආ.ම. යෙන් ලබාගනු ලබන ආකෘති පත්‍රයක් පුරවා ඉල්ලුම් කළ යුතුය. ලියාපදිංචි අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.

පුහුණුව සඳහා අය කෙරෙන ගාස්තු: කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.

අභ්‍යාසලාභීන්ට මුදලින් කෙරෙන ආධාර: පහත දැක්වෙන පරිදි මාසික වේතනයක් ගෙවනු ලැබේ.

ප්‍රථම වර්ෂය රු: 300/-

දෙවන වර්ෂය රු: 315/-

තෙවන වර්ෂය රු: 330/-

සිව්වන වර්ෂය: රු: 345/

3. අ 3 වර්ගය-කර්මාන්ත ආධුනිකත්ව පාඨමාලා

ඉදිකිරීමේ කර්මාන්ත:

කාලය: අවුරුදු 1 1/2-4

මට්ටම; කර්මාන්ත ශිල්පි

ස්ථානය: රජයේ හා පෞද්ගලික ආයතන

ඇතුළත්වීමේ අවශ්‍යතා: අටවැනි ශ්‍රේණිය සමත්වීම

තෝරාගැනීමේ ක්‍රමය: ලියාපදිංචි කිරීම සහ ජා.ආ.ම යෙන් ලබාගතයුතු ආකෘති පත්‍රයක් පුරවා ඉල්ලුම් කළ යුතුය. ලියාපදිංචි අපේක්ෂකයින්, සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලැබේ.

පුහුණුව සඳහා අය කෙරෙන ගාස්තු: කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.

අභ්‍යාසලාභීන්ට මුදලින් කෙරෙන ආධාර: පහත දැක්වෙන පරිදි මාසික වේතනයක් ගෙවනු ලැබේ.

ප්‍රථම වර්ෂය රු: 300/-

දෙවන වර්ෂය රු: 315/-

තෙවන වර්ෂය රු: 330/-

සිව්වන වර්ෂය රු: 345/-

ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආධුනිකත්ව පාඨමාලා:

කාලය: අවුරුදු 4-5

මධ්‍යම කාර්මික ශිල්පි

ස්ථානය: රජයේ හා පුද්ගලික අංශය

ඇතුළත්වීමේ අවශ්‍යතා: දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව, ගණිතය සහ භෞතික විද්‍යාවඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙ) විභාගය සමත්වීම

තෝරාගනු ලැබීමේ ක්‍රමය: දැන්වීම් ප්‍රසිද්ධ කිරීමෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අපේක්ෂකයින් තෝරා ගැනීම හා ලියාපදිංචි කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වේ.

පුහුණුව සඳහා අය කෙරෙන ගාස්තු: කිසිදු මුදලක් අය නොකෙරේ.

අභ්‍යාසලාභීන්ට මුදලින් කෙරෙන ආධාර:- පහත දැක්වෙන පරිදි මාසික වේතනයක් ලැබේ.

ප්‍රථම වර්ෂය රු: 300/-

දෙවන වර්ෂය රු: 315/-

තෙවන වර්ෂය රු: 330/-

සිව්වැනි වර්ෂය රු: 345/-

ආධුනිකත්ව පාඨමාලා පිළිබඳ වැඩිදුර විස්තර සඳහා මෙසේ විමසන්න.

**සභාපති**

ජාතික ආධුනිකත්ව මණ්ඩලය,
5, ගාලුපාර,
කොළඹ 5.